වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report

2024

Shrama Vasana Fund
No. 97, Jawaththa Road,
Colombo 5.
Tel :- 0112 588 936   Fax :- 0112 588 937
Email :- infor@svf.gov.lk
Web :- svf.gov.lk

වාර්ෂික වාර්තාව

2024

ශ්‍රම වාසනා අරමුදල

சிரமவாசனாநிதியம

ShramaVasana Fund

පටුන

පළමු පරිච්ඡේදය - ආයතනික පැතිකඩ

1.1. හැඳින්වීම	04
1.2. දැක්ම, මෙහෙවර,	04
1.3. ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු	05
1.4. මූලික අගයන් හා චර්යාධර්ම	05
1.5. පාලන ව්‍යුහය හා කාර්ය මණ්ඩල සංයුතිය	06 - 07
1.6. සංවිධාන සටහන	08
1.7. ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාපනය කර ඇති කමිටු	09 - 11

දෙවන පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. අරමුදලේ වර්ධනය	12
2.2 ලොතරැයි ආදායම	13
2.3 වැඩ පරිසරය අරමුදල සතු සම්පත්	14
2.4 ශදුඅත විශ්ලේෂණය හා වර්තමාන අභියෝග	
2.4.1 ශදුඅත විශ්ලේෂණය	15 - 16
2.4.2 ශ්‍රම වාසනා අරමුදලේ වර්තමාන අභියෝග	16

තුන්වන පරිච්ඡේදය - 2024 වසරේ කාර්යසාධනය

3.1 වසරේ කාර්යසාධනය	17
3.1.1 දැනුවත් කිරීමේ වැඩසටහන	18 - 19
3.1.2 අධ්‍යාපනික ආධාර වැඩසටහන	19
3.1.3 මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන	20
3.1.4 නීති ආධාර ලබාදීමේ වැඩසටහන	20
3.1.5 වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන	21

හතරවන පරිච්ඡේදය - මූල්‍ය තොරතුරු

4.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	23
4.2 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	24
4.3 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	25
4.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය	26
4.5 මූල්‍ය ප්‍රකාෂණවලට අදාල සටහන්	27 - 32

පස්වන පරිච්ඡේදය - ගිණුම්කරණ ප්‍රතිපත්ති හා විගණකාධිපති වාර්තාව

5.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති	33 - 37
5.2 විගණකාධිපති වාර්තාව	38 - 43

හයවන පරිච්ඡේදය -

6.1 විගණන වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය	44 - 46
6.2 ශ්‍රම වාසනා අරමුදල ඇවර කිරීම පිළිබඳ හෙළිදරව් කිරීම	47
ඇමුණුම්	48 - 51

පළමු පරිච්ඡේදය

1.1 ශ්‍රම වාසනා අරමුදල හැදින්වීම

1998 අං ක 12 දරන (2019 අංක 15 දරන සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු විෂයභාර අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුභසාධනය ප්‍රවර්ධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. එකී පනතේ සඳහන් ප්‍රධාන අරමුණු 06ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වමින් ශ්‍රී ලාංකීය සේවා නියුක්තයන්ගේ උන්නතියට තම ආයතනික නායකත්වය සපයා ඇත.

ශ්‍රම වාසනා අරමුදලට අරමුදල් සැපයෙන ප්‍රධාන මාර්ගය ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දිනුම් අදිනු ලබන Lucky7 ලොතරැයියෙන් ලැබෙන ආදායමයි. මෙම ආදායම තීරණය වන්නේ ලොතරැයි අලෙවියෙන් වන අතර ලොතරැයි අලෙවිය වර්ධනයත් සමඟ කම්කරු ජනතාව උදෙසා සිදු කෙරෙන සුබසාධන සේවාවන් ද වර්ධනය වේ.

1.2 දැක්ම හා මෙහෙවර

දැක්ම

"තෘප්තිමත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්"

මෙහෙවර

"කම්කරු ප්‍රජාවට සුබසාධනය සැපයීම හා විපතකදී පිහිටවීම සඳහා පවතින යාන්ත්‍රණයන්ගේ අඩුපාඩු පුරවමින් වඩා පොහොසත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායකත්වය සැපයීම"

1.3 අරමුදලේ අරමුණු

1) සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම.

2) සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම.

3) හදිසි අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම.

4) සේවා නියුක්තයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම.

5) ව්‍යසන අවස්ථා වලදී සේවා නියුක්තයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම.

6) සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම.

1.4. මූලික අගයන් සහ චර්යාධර්ම.

- ශ්‍රම වාසනා අරමුදල මගින් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සඳහා කාර්යක්ෂම වූ සේවාවක් සැපයීම සඳහා වන සදාචාරාත්මක බැඳීම තහවුරු කිරීම
- සේවා සැපයීමේදී සේවාලාභීන් සඳහා ශ්‍රම වාසනා අරමුදලේ නීති රෙගුලාසි හා ක්‍රමවේදයන් ට යටත්ව ඉහල ගුණාත්මක සේවාවක් ලබා දීම
- ශ්‍රම වාසනා අරමුදල මගින් සිදු කරනු ලබන සේවාවන් පිළිබඳව සේවාලාභීන් තුල වඩා දැනුවත් භාවයක් ඇති කිරීම

ශ්‍රම වාසනා අරමුදල සඳහා ලැබීම්

(අ) පාර්ලිමේන්තුව විසින් අරමුදලේ අරමුණු ඉටු කර ගැනීමේ කාර්යය සඳහා වරින් වර සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්

(ආ) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග හෝ පරිත්‍යාග වශයෙන් ලැබෙන සියළුම මුදල්

(ඇ) අරමුදල මඟින් සිදු කරන ආයෝජනවලින් ආදායම වශයෙන් ලැබෙන මුදල්

(ඈ) ශ්‍රම වාසනා අරමුදල් පනතේ 13 වන වගන්තියේ සඳහන් ලොතරැයිවලින් ලැබෙන මුදල් ද ඇතුළුව එකී පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරිමේදී සහ කර්තව්‍ය ඉටු කිරිමේදී අරමුදල වෙත ලැබෙන සියළුම මුදල්

1.5. පාලන ව්‍යුහය හා කාර්යමණ්ඩල සංයුතිය

1998 අංක 12 (2019 අංක 15 දරන සංශෝධිත) දරන ශ්‍රම වාසනා අරමුදල් පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු විෂයභාර අමාත්‍යාංශය යටතේ පවතින අතර, අරමුදලේ සභාපතිත්වය අරමුදල අයත් රේඛීය අමාත්‍යාංශයේ ලේකම් සතු වේ. අරමුදලේ පාලන කටයුතු පිළිබඳ සම්පූර්ණ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති අතර මෙම අධ්‍යක්ෂ මණ්ඩලය නිලබලයෙන් හා පත්කළ සාමාජිකයන්ගෙන් සමන්විත වේ. අරමුදල කළමනාකරණය හා ඊට අදාල සියලුම කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හා අධීක්ෂණය යටතේ සිදු කරනු ඇත.

2024 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය

නිලබලයෙන් පත්වන සාමාජිකයන්

ආර්.පී.ඒ. විමලවීර මහතා	සභාපති
එච්.කේ.කේ.ඒ. ජයසුන්දර මහතා	සාමාජික
ජේ.එච්.එස්.පී. ජයමහ මහතා	සාමාජික
ජේ.එම්.එච්.එන්.ජී. ජයසේකර මහතා	සාමාජික

කම්කරු විෂයභාර අමාත්‍යවරයා විසින් පත්කළ සාමාජිකයන්

ඩී. සී. යූ. පිරිස් මහතා	සාමාජික
ඩී. එස්. පුෂ්පකුමාර මහතා	සාමාජික
මහේන්ද්‍ර කුමාරසිංහ මහතා	සාමාජික
ආර්. එම්. යූ. ටී. කේ. රත්නායක මහතා	සාමාජික

2024-12-31 දිනට ආයතනයේ කාර්ය මණ්ඩල සංයුතිය

සේවා සංයුතිය	අනුමත සංඛ්‍යාව	සේවයේ නියුක්ත සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	01	01	00
තෘතීය මට්ටම	05	03	02
ද්විතීය මට්ටම	08	05	03
ප්‍රාථමික මට්ටම	04	02	02
එකතුව	**18**	**11**	**07**

1.6. ශ්‍රම වාසනා අරමුදලේ 2024-12-31 දිනට සංවිධාන සටහන



1.7. ශ්‍රම වාසනා අරමුදලේ ස්ථාපනය කර ඇති කමිටු

1. අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව
2. ප්‍රතිලාභ කමිටුව
3. ප්‍රගති සමාලෝචන කමිටුව

- **අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව**

ශ්‍රම වාසනා අරමුදලේ අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුව ස්වාධීනව ක්‍රියාකරන අංශයක්වේ. මෙම කමිටුවේ මූලික අරමුණ ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු, සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්මේ නිර්ණායක / නිර්දේශ පදනම් කර ගනිමින් අරමුදලේ ආයතනික පාලනය, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම ආදී කාර්යන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමයි.

එසේම ගිණුම් කටයුතු මෙහෙයවීමේ දී මූල්‍ය ප්‍රකාශන වාර්තාකරණයේ විශ්වසනීයත්වය, වංචා හා අඩුපාඩු වලක්වා ගැනීම, වත්කම් ආරක්ෂා කිරීම වැනි කාර්යයන්වලට බලපාන නීති රීතින්වල අනුකූලතාවය ආරක්ෂා කරගැනීම පිළිබඳ විමසිලිමත් වීමයි.

අභ්‍යන්තර විගණන කමිටුවේ ප්‍රධානියා/සභාපති, සෘජුවම අරමුදලේ සභාපති වෙත වාර්තා කරන අතර මෙම විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2024 වසරේ විගණන හා කළමනාකරණ කමිටුව පහත සාමාජිකයින් ගෙන් සමන්විත විය.

1. ජේ. එච්.එස්.පී. ජයමහ මහතා	භාණ්ඩාගාර නියෝජිත
2. ඩී. සිසිර පුෂ්පකුමාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
3. ආර්. එම්.යූ.ටී කේ. රත්නායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4. ජී.ඩී.ඩී. එස්.එම්. සේනාධීර මහත්මිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක- කම්කරු අමාත්‍යාංශය
5. බී. අයි.එන්. පෙරේරා මහත්මිය	විගණන අධිකාරී - ජාතික විගණන කාර්යාලය

අභ්‍යන්තර විගණන හා කළමනාකරණ කමිටුවේ මූලික කාර්යයන්

1. ශ්‍රම වාසනා අරමුදලේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම සහ ඇගයීම
2. අරමුදලේ පූර්ව නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැගී තිබේ නම් ඒවාට අදාළ බලපෑම් විමර්ශනය කිරීම.
3. අලාභහානි සහ වංචාවලින් තොරව වත්කම් ආරක්ෂිතව පවත්වාගෙන යාමට උපදෙස් ලබාදීම
4. ගණුදෙනුවල අවශ්‍යතාවය හා ප්‍රතිලාභ විමර්ශනය කිරීම, නාස්තිය සහ අසාමාන්‍ය ලෙස වැඩිපුර වියදම් කිරීම, වත්කම් ඉවත් කිරීම තුළින් සිදුවන ලාභ පාඩු සහ වියදම් අඩු කිරීම් වාර්තා පිළිබඳව විමර්ශනය කිරීම.
5. විගණන කමිටු රැස්වීමට පියවර ගැනීම හා විගණන තීරණ සැකසීම වෙනුවෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමට අංශ ප්‍රධානීන් වෙත යොමු කිරීම.
6. විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම.
7. අරමුදලේ සභාපති හෝ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ ඉල්ලීමක දී විශේෂ විමර්ශන පැවැත්වීම.
8. අරමුදලේ සභාපති/අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කරනු ලබන විවිධ කමිටුවලට සහයවීම හා නිර්දේශ ලබාදීම.

- **ප්‍රතිලාභ කමිටුව.**

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු ප්‍රකාරව සිදුකරන ශිෂ්‍යත්ව ලබාදීම, වෛද්‍යාධාර ලබාදීම, නීති ආධාර ලබාදීම යන වැඩසටහන්වලට අදාල ව ප්‍රතිලාභීන් තෝරා ගැනීම, ඒ සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්ණායක පදනම් කර ගනිමින් ප්‍රතිලාභ කමිටුව විසින් සිදු කරයි. මෙම කමිටුව අරමුදලේ සාමාන්‍යාධිකාරී, රේඛීය අමාත්‍යාංශයේ නීති අංශයේ නිලධාරීවරයෙකු, වෘත්තීය රෝග විශේෂඥ වෛද්‍යවරයකු, කම්කරු වන්දි කොමසාරිස්, හා කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරයකු යන අයගෙන් සමන්විත වේ. අනුමත නිර්ණායකවලට අනුව විධිමත් ක්‍රමවේදයකට ප්‍රතිලාභීන් තෝරා ගැනීමට මෙම කමිටුව උපකාරී වේ.

- **ප්‍රගති සමාලෝචන කමිටුව.**

විගණනය විසින් වරින් වර ලබාදුන් උපදෙස් අනුව ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත පිහිටුවන ලද කමිටුවකි. ශ්‍රම වාසනා අරමුදලේ දෛනිකව කටයුතු සොයාබැලීම මෙම කමිටුවේ ප්‍රධාන කාර්යය වේ. ශ්‍රම වාසනා අරමුදලේ කළමනාකරු, ගණකාධිකාරී සහ සහකාර කළමනාකරු යන තිදෙනාගෙන් මෙම කමිටුව සමන්විත වන අතර, විශේෂයෙන් එදිනෙදා සිදුකරන කටයුතු, නිම කරන ලද ලිපිගොනු සකස්කිරීම, සැලසුම් කරන ලද වැඩ හා සත්‍ය ලෙස සිදු වී ඇති තත්ත්වයන් පිලිබඳ සොයාබලා වැරදි හා අඩුපාඩු මගහරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම යන කටයුතු සිදු කරයි. ලිපිගොනු අඩුපාඩු රහිතව පවත්වා ගෙන යාමට හා වැඩසටහන් ක්‍රමවත්ව සිදුකිරීමට මෙම කමිටුව පිටිවහලක් වී ඇත.

දෙවන පරිච්ඡේදය

2.1. ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය

ශ්‍රම වාසනා අරමුදලේ වර්ධනය (රුපියල් මිලියන)					
	2020	2021	2022	2023	2024
අරමුදලේ වටිනාකම	332	347	379	410	351
අරමුදලේ වර්ධනය	0	15	32	31	-59
වර්ධන ප්‍රතිශතය	0%	5%	9%	8%	-14%



2.2.ලොතරැයි ආදායම

ලොතරැයි ආදායම (රුපියල් මිලියන)					
	2020	2021	2022	2023	2024
ලොතරැයි ආදායම	30	28	38	66	60
ආදායම වර්ධනය	-30	-2	10	28	-6
වර්ධන ප්‍රතිශතය	-	-7%	36%	74%	-9%



2.3. ශ්‍රම වාසනා අරමුදලෙහි වැඩ පරිසරය

ශ්‍රම වාසනා අරමුදල් කාර්යාලය කොළඹ 05, අංක 97 ජාවත්ත පාර දරණ ලිපිනයෙහි පිහිටි ගොඩනැගිල්ලේ දෙවන මහලේ ස්ථාපිත අතර, එය වර්ග අඩි1500 ක් පමණ ප්‍රමාණයක යහපත් කාර්යාල පරිසරයකින් යුක්තවේ. කාර්යාලයට වාහනයකින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි නමුත් එය ප්‍රධාන ගමනා ගමන මාර්ගයක පිහිටා නොමැති බැවින් සේවා ලබා ගැනීම සඳහා පැමිණෙන අයට තරමක් අපහසු වනු ඇත. දැනට පවතින කාර්යාලීය ඉඩ පහසුකම් වර්තමාන කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් නමුත් ගබඩා සහ අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් ඉඩක් නොමැත.

අරමුදල සතු සම්පත්

- **ශ්‍රම වාසනා අරමුදලෙහි කිර්තිනාමය**

  ශ්‍රම වාසනා අරමුදල විසින් ශ්‍රී ලාංකික සේවා සේවක ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සහ වැඩසටහන් හේතුවෙන් රටේ සේවක ප්‍රජාව මෙන්ම සාමාන්‍ය ජනතාව අතරත් අරමුදල පිලිබඳ කීර්තියක්, ප්‍රතිරූපයක් සහ සමාජ විශ්වාසයක් ආරම්භයේ සිට ම නිර්මාණය කර පවත්වාගෙන ඒමට හැකි වී තිබේ.

  ශ්‍රම වාසනා අරමුදලෙහි කිර්තිනාමය කාලීනව ගොඩනගාගත් වටිනාකමක් වන අතර එය අස්පෘශ්‍ය ප්‍රතිලාභයක් වේ මේ තුලින් සේවා සේවක ප්‍රජාව සහ ආයතන (රාජ්‍ය හා පෞද්ගලික) අතර වඩා හොඳ සහයෝගීතාවයක් ඇති කර ගැනීමට හැකි වී තිබේ.

- **මානව සම්පත්**

  සාමාන්‍යාධිකාරී, කළමනාකරු, ගණකාධිකාරී, කළමනාකරණ සහකාරවරුන් හතර දෙනෙක්, සහ රියදුරන් දෙදෙනෙකුගෙන් සමන්විත මානව සම්පතක් ආයතනය සතු වේ.

- **උපකරණ**

  ආසන දහසයක් සහිත වෑන් රථයක්, මෝටර් රථයක්, පරිගණක දහතුනක්, ඡායා පිටපත් යන්ත්‍ර දෙකක්, ෆැක්ස් යන්ත්‍රයක්, ලැප්ටොප් පරිගණක හතක්, රූපවාහිනී තුනක්, කළු සුදු මුද්‍රණ යන්ත්‍ර පහක්, වර්ණ මුද්‍රණ යන්ත්‍රයක්, වායුසමීකරණ යන්ත්‍ර හතරක් , කැමරාවක්, හඬ පටිගත කිරීමක් සහ ඇඟිලි සලකුණු යන්ත්‍රයකින් සමන්විතය.

- **ගෘහ භාණ්ඩ සහ උපාංග**

  මේස දහහතරක්, පුටු දහහතරක්, සෝෆා කට්ටලයක්, ටෙන්ඩර් පෙට්ටියක්, පුටු සහිත සම්මන්ත්‍රණ මේසයක් ගෘහ භාණ්ඩ ආයතනය සතුව පවතී.

2.4. ශුද්‍ධත විශ්ලේෂණය හා වර්තමාන අභියෝග

2.4.1. ශුද්‍ධත විශ්ලේෂණය (SWOT Analysis) - ශ්‍රම වාසනා අරමුදල

❖ බාහිර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් ශ්‍රම වාසනා අරමුදලට බලපාන අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම ද , අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීම තුළින් ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීම ද සිදු කරයි. SWOT විශ්ලේෂණය මඟින් අරමුදලේ උපාය මාර්ගික දිශානතිය, ඉලක්ක සහ අරමුණු නිර්ණය කිරීමට පහසුකම් සපයනු ලබයි.

➢ **ශක්තීන්**

- අරමුදලේ සැලකිය යුතු විශාලත්වය, ප්‍රධාන අරමුදල් මූලාශ්‍රය වන හොඳින් ස්ථාපිත ලොතරැයියක් තිබීම
- ලොතරැයි ආදායම හැර විවිධ ක්‍රියාකාරකම් හරහා සහ විවිධ මූලාශ්‍රවලින් අරමුදල පුළුල් කිරීමේ හැකියාව
- ශක්තිමත් රාජ්‍ය ආයතන කිහිපයක පිටුබලය - කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය, ජාතික ලොතරැයි මණ්ඩලය හා මුදල් අමාත්‍යාංශය.
- පාර්ලිමේන්තු පනතක් මගින් අනුබල දෙන ශක්තිමත් නීති රාමුවක් තිබීම.
- ත්‍රෛපාර්ශ්වික සංඝටක නියෝජනය කරන පළපුරුදු සහ දක්ෂ සාමාජිකයන්ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් තිබීම.
- සුදුසුකම් ලත් සහ දක්ෂ කාර්යමණ්ඩලයක් සිටීම.
- ISO 9001:2015 තත්ව පාලන පද්ධතියක් තිබීම.
- වෙබ් අඩවියක් හා වෙබ් පාදක තොරතුරු පද්ධතියක් තිබීම.
- මෝටර් රථයක් හා වෑන් රථයක් සතුවීම.

➢ **දුර්වලතා**

- සමස්ත වෙළඳපොළට ලොතරැයිපත් සැපයීමට නොහැකි වීම, වෙළඳපොළ ඉතා විශාල වීම හා සංවිධානය කුඩා වීම, විමධ්‍යගත මෙහෙයුමක් සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් හෝ අවශ්‍ය සම්පත් සීමිත වීම.
- ගනුදෙනුකරුවන් ගැන පැහැදිලි අදහසක් නොමැති වීම.
- අරමුදලේ සේවාවන් පිරිනමනු ලබන සේවාදායක කණ්ඩායම හෝ සාමාන්‍ය ජනතාව අතර අරමුණු ප්‍රචලිත නොවීම.
- මෙහෙයුම් පුළුල් කිරීම සඳහා ශ්‍රම වාසනා ලොතරැයිය අලෙවිය වර්ධනය නොවීම.
- ශාඛා නොමැති අතර එබැවින් බාහිර මෙහෙයුම් සඳහා කම්කරු දෙපාර්තමේන්තුව මත යැපීමට සිදු වීම.

- **අවස්ථාවන්**

- විශාල වෙළඳපොළක් පවතින අතර සංස්ථාපන පනත මඟින් අරමුදලට ලබාදී ඇති පුළුල් බලතල අනුව විෂය පථය පුළුල් කිරීමේ හැකියාවක් පවතී.
- තුන්වන ලෝකයේ ශ්‍රම බලකායට ඔවුන්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් සැපයීමට කැමැත්තෙන් සිටින රාජ්‍ය නොවන සංවිධාන විශාල සංඛ්‍යාවක් සිටින අතර, අරමුදල හා එහි ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා ඒවා භාවිතා කිරීමේ හැකියාවක් පවතී.
- ලොතරැයිපත් මිලදී ගත් අයට සේවා සැපයීමේදි ප්‍රමුඛතාවයක් ලබාදීම තුලින් ප්‍රතිලාභීන් සහ ආදායම් මාර්ගය (ලොතරැයිය) අතර සම්බන්ධයක් ඇතිකර ගැනීමේ හැකියාව

- **තර්ජන**

- ලොතරැයි අතර තරඟයක් පවතින අතර වෙළඳපොළ තුළ බොහෝ ලොතරැයි පැවතීම.
- නව ලොතරැයි වෙළඳපොළට හඳුන්වාදීම හේතුවෙන් පවතින ලොතරැයි වල අදායම පහත වැටීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය 8 දෙනෙකු ගෙන් සමන්විත වීම හා ඉන් හතර දෙනෙකු අමාත්‍යවරයා විසින් පත් කිරීම මත තීරණ ගැනීමේදී ඇතිවන අපහසුතාවය.

2.4.2.ශ්‍රම වාසනා අරමුදලේ වර්තමාන අභියෝග

- 2025 වසර තුල අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ශ්‍රම වාසනා අරමුදල ඇවර කිරීමට තීරණය කර තිබීම.
- අරමුදල ඇවර කිරීම සිදු වුවහොත් පනතේ අරමුණු ඉදිරියේ දී ඉටු කරන ආකාරය.
- පනතේ ඇති සමහර අරමුණු ශ්‍රම වාසනා අරමුදලට පමණක් සීමා වී ඇති නිසා අරමුදල ඇවර කිරීමෙන් එම අරමුණු ඉටු කිරීම පිළිබඳ ගැටලුකාරී තත්වය.
- අරමුදලේ දැනට සිටින සේවක සේවිකාවන්ගේ රැකියා සුරක්ෂිත භාවය පිළිබඳ අවිනිශ්චිත බව.
- ශ්‍රම වාසනා අරමුදලේ දැනට පවතින පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීම සිදු නොකරන ලෙස දන්වා ඇති පසුබිමක සීමිත කාර්ය මණ්ඩලයකින් වැඩසටහන් සිදුකර ගැනීම අපහසු වී තිබීම.

තුන්වන පරිච්ඡේදය

3.1. වර්ෂයේ කාර්යසාධනය

ශ්‍රී ලංකාව තුළ පැවති අර්බුධකාරී තත්වය 2024 වසර ආරම්භය වනවිට යම් මට්ටමකට පහව ගියත් රට තුල ඇති වූ ආර්ථික පරිහානිය සහ විශේෂයෙන්ම ඉන්ධන මිල ඉහල යාම වැනි හේතු නිසා රටේ නිෂ්පාදන හා අනෙකුත් කර්මාන්ත හා සේවා කටයුතුවල පසුබෑමක් ඇති විය. භාණ්ඩ මිල ඉහල යාම තුලින් මිනිසුන්ගේ දෛනික පරිභෝජනයන් පවා සීමා කිරීමේ තත්වයකට රට පත් විය. වසරේ මුල් කාර්තුව වන විට විදේශ ගත ශ්‍රමික ප්‍රේෂණ වර්ධනය වීම හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග ඇති කර ගත් එකඟතා තුලින් යම් සාධනීය මට්ටමක් ලගාකර ගැනීමට හැකි වුවත් රටතුල පැවති උද්ධමනකාරී තත්වයේ අඩු වීමක් සිදු නොවිය.

මෙම තත්වය තුල ශ්‍රම වාසනා අරමුදල 2024 වර්ෂය වෙනුවෙන් සැලසුම් කරන ලද වැඩසටහන් ඒ ආකාරයෙන්ම සිදු කිරීමට නොහැකි විය. ඒ වනවිට ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව ලංකාවේ පාසල් අධ්‍යාපනය ලබන දරුවන්ගෙන් බහුතරයකට අධ්‍යාපන වියදම් දරාගැනීමට නොහැකිව පාසල් හැර යන තත්ත්වයක් පවතින බවට ප්‍රකාශ කර තිබිණි.

මේ පිලිබඳ අවධානය යොමුකල ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය පවතින තත්ත්වය තුළ ශ්‍රමික පවුල් ඉලක්ක කර ඔවුන්ගේ අධ්‍යාපනය ලබන දරුවන් වෙත යම් සහනයක් ලෙස පාසල් උපකරණ ලබා දීමට තීරණය කරන ලදි.

ඒ අනුව ශ්‍රම වාසනා අරමුදල 2024 වෙනුවෙන් සැලසුම් කර තිබූ සමහර වැඩසටහන් සංශෝධනය කර සිදු කිරීමටත් තීරණය කරන ලදී. මෙසේ ශ්‍රම බලකාය ඉලක්ක කරමින් ශ්‍රම වාසනා අරමුදල විසින් විවිධ අරමුණු ඔස්සේ වැඩසටහන් සිදු කරමින් සේවක සුභසාධනය ඉහළ නැංවීමට කටයුතු කරගෙන යනු ලබයි .

ශ්‍රම වාසනා අරමුදල මඟින් සිදුකරනු ලබන වැඩසටහන් පහත දැක්වේ.

- දැනුවත් කිරීමේ වැඩසටහන්
- අධ්‍යාපනික ආධාර වැඩසටහන්
- මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන
- නීති ආධාර ලබාදීමේ වැඩසටහන
- වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන
- වෛද්‍ය කඳවුරු පැවැත්වීම

ශ්‍රම වාසනා අරමුදලේ 2024 වර්ෂයේ මුළු ආදායම රු. මි.69ක් වන අතර පරිපාලන වියදම් හා වැඩසටහන් වියදම් ඇතුළුව 2024 වර්ෂයේ මුළු වියදම රු.මි.92ක් වේ. ශ්‍රම වාසනා අරමුදල සඳහා මුළු ලැබීම් රු.මි.126.78ක් වේ.

2024 වර්ෂයේ කාර්යසාධනය ලඟාකර ගැනීමේදී ආයතනය සතු සම්පත් උපරිම හා කාර්යක්‍ෂම ලෙස යොදාගැනීම හා සෑම විටෙකම පිරිවැය අවම කර ගැනීම අරමුණු කර පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදී.,

- යම් දිස්ත්‍රික්කයක, හෝ ප්‍රදේශයක පැවැත්වීමට සැලසුම් කර ඇති වැඩසටහන් සඳහා යාමේදී එම යන අතර සැලසුම් කර ඇති වෙනත් වැඩසටහන් ද එම ගමනාන්තය අතරතුර සිදු කිරීම.
- ශ්‍රම වාසනා අරමුදලේ කාර්යමණ්ඩලය අඩු බැවින් වැඩසටහන් සිදුකරන ප්‍රදේශයන් හි කම්කරු කාර්යාල, කම්කරු අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරින් සම්බන්ධ කරගනු ලබයි.
- රාජ්‍ය වියදම් පාලනය කිරීමේ චක්‍රලේඛනය අනුව අනුව ශ්‍රම වාසනා අරමුදලේ වියදම් පාලනය කර ඇත.
- විදුලිය පිරිමසා ගැනීම සඳහා විදුලි බල්බ දැල්වීම අවම කිරීම (පෙ.ව 8.30 - ප.ව 4.15 දක්වා පමණක් දැල්වීම.)

3.1.1.දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණු අතර සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කිහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරුවලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුළින් සිදු වී ඇති බව පැහැදිලි විය.

මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසරවල අනතුරු වාර්තා වී ඇති හා අවදානම් තත්ත්වයන් හඳුනාගත් කර්මාන්තශාලා ඉලක්ක කර ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිදුකරන ලදී.

එසේම කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරි තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කරන ලදී.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර කම්කරු අණපනත් පිළිබඳ සේවක සේවිකාවන් හා සේව්‍ය ප්‍රජාව දැනුවත් වූ අතර වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුළින් කාර්මික අනතුරු අවම කිරීමටත් හැකියාව ලැබී ඇති බව පැහැදිලිය.

2024 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක ප්‍රමාණයක් මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකිරීමට හැකියාව ලැබුණු අතර මේ තුළින් සෘජුවම සේවක සේවිකාවන් 1000 ක් පමණ ප්‍රතිලාභ හිමිකර ගන්නා ලදී. (ඇමුණුම 01)

වෙන්කර ඇති මුදල (රුපියල්)	වියදම් වූ මුදල (රුපියල්)	කාර්යසාධනය %
1,440,000.00	319,646.96	22.20%

3.1.2.අධ්‍යාපනික ආධාර වැඩසටහන්

රට තුළ පවතින ආර්ථික තත්ත්වය හමුවේ ශ්‍රමික පවුල් වෙත සහන සැලසීමේ අරමුණින් ලංකාවේ සියලුම දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි තෝරාගත් අඩු ආදායම්ලාභී ශ්‍රමික පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් අධ්‍යාපනික ආධාර ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කරනු ලබයි.

මෙහිදි දූ දරුවන් 30,010 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.

සිදුකල වැඩසටහන්	වෙන්කරන ලද මුදල (රුපියල් මිලියන)	වියදම (රුපියල් මිලියන)	කාර්යසාධනය %
1. විශේෂ ව්‍යාපෘතිය	100	66	66%
2. සාමාන්‍ය ව්‍යාපෘතිය	12.50	6.7	54 %

3.1.3.මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන

ශ්‍රී ලංකාවේ තුළ කර්මාන්තශාලා තුළ සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කරගනිමින් ප්‍රතිලාභින් හඳුනාගන්නා අතර මියගිය හෝ පූර්ණ ආබාධිත තත්ත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා එනම් වයස අවු. 3-25 දක්වා) දරුවන් මේ සඳහා සුදුසුකම් ලබන අතර, මෙම දරුවන් සඳහා රු.50,000 ක ඉතිරිකිරීමේ තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දීම සිදුකරයි.

2024 වර්ෂය තුළ ශිෂ්‍යත්වලාභින් 18 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත. (ඇමුණුම 03)

වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල රුපියල්	වියදම් වූ මුදල රුපියල්.	කාර්යසාධනය %
5,600,000.00	1,130,891.21	20.19%

3.1.4.නීති ආධාර ලබාදීමේ වැඩසටහන

පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථාවල දි, පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවල දි, සහ සේවය අහිමි කිරීමට එරෙහිව කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර ඇති අවස්ථාවකදි සේවකයන්ට සහන ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

මෙහිදි 2024 වර්ෂය තුල ක්‍රියාකාරි සැලැස්ම අනුව වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් 06 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත. (ඇමුණුම 03)

වෙන් කර ඇති මුදල (රුපියල්)	වියදම (රුපියල්)	කාර්යසාධනය %
1,000,000.00	144,350.00	14.44%

3.1.5.වෛද්‍ය ආධාර ලබාදීමේ වැඩසටහන

වෘත්තීය රෝගවලට ගොදුරු වූ සේවක සේවිකාවන් වෙනුවෙන් සහන සැලසීම ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු අතර ඇති තවත් එක වැදගත් අරමුණකි. වෘත්තීය රෝගවලට ගොදුරු විය හැකි අවධානම් සහිත පාරිසරික තත්ත්වයන් යටතේ සේවය කරන සේවක සේවිකාවන් අතරින් මෙම පිරිස් තෝරා ගෙන ඒ අනුව එවැනි පිරිස් ඉලක්ක කර වෛද්‍ය කඳවුරු පවත්වනු ලැබේ .

සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය තත්වයන් හා සැබෑ ලෙසම වෘත්තීය රෝගවලට ගොදුරු වූ සේවක සේවිකාවන් හඳුනා ගැනීමත්, ඉදිරියේ දී වෘත්තීය රෝගවලට ගොදුරුවීමේ අවදානමක් ඇති පිරිස් ඉන් මුදවා ගැනීමත් මෙමගින් සිදු කරයි.

වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල රුපියල්.	**වියදම් වූ මුදල රුපියල්**	**කාර්යසාධනය %**
420,000.00	244,460.00	58.20%

හතරවන පරිච්ඡේදය

මූල්‍ය තොරතුරු

4.1. මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ශ්‍රම වාසනා අරමුදල 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය			
		රුපියල් 2024	රුපියල් 2023 (ගලපන ලද)
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන අයිතම	*සටහන 03*	41,862,198	1,531,654
තොගය	*සටහන 05*	710,513	3,776,722
තැන්පතු (තැපැල් යන්ත්‍රය)		64	64
ක්‍රමක්ෂය කළ පිරිවැයට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම		50,694,144	52,437,123
ලැබිය යුතු මුදල්	*සටහන 04*	351,629,419	411,503,820
		444,896,338	469,249,383
ජංගම නොවන වත්කම්			
ක්‍රමක්ෂය කළ පිරිවැයට ස්ථාවර තැන්පතු ආයෝජනය කිරීම		45,041,096	39,416,096
අස්පෘශ්‍ය වත්කම්	*සටහන 02*	1,903,782	1,114,833
යන්ත්‍රෝපකරණ සහ උපකරණ	*සටහන 01*	7,156,038	7,404,212
		54,100,916	47,935,141
මුළු වත්කම්		498,997,254	517,184,525
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු දේ	*සටහන 07*	379,723	255,885
ප්‍රතිපාදන	*සටහන 08*	1,323,000	1,437,080
ජංගම නොවන වගකීම්			
කාර්ය මණ්ඩල පාරිතෝෂික ප්‍රතිපාදන		3,252,238	2,396,660
මුළු වගකීම්		4,954,960	4,089,625
ශුද්ධ වත්කම්		494,042,294	513,094,900
සමුච්චිත අතිරික්තය	*සටහන 06*	491,857,794	510,547,900
සංචිත			
රජයේ ප්‍රදාන		2,184,500	2,547,000
මුළු ශුද්ධ වත්කම්		494,042,294	513,094,900

මෙහි පිටු අංක 28 සිට 33 දක්වා ඇති ගිණුම්වලට අදාළ සටහන් හා ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසක් වේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAs) අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කර ඉදිරිපත් කරන ලදී.

ශ්‍රම වාසනා අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් අය අත්සන් කර ඇති අතර එය ඉංග්‍රීසි පිටපතෙහි දක්වා ඇත.

එස්.එම්. පියතිස්ස.	එච්.කේ.කේ.ඒ. ජයසුන්දර	ඩී.ආර්. ජයලත්	එම්.එල්.ජයමාලි
සභාපති	අධ්‍යක්ෂ	සාමාන්‍යාධිකාරී	ගණකාධිකාරී
ශ්‍රම වාසනා අරමුදල.	ශ්‍රම වාසනා අරමුදල.	ශ්‍රම වාසනා අරමුදල.	ශ්‍රම වාසනාඅරමුදල.

4.2. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ශ්‍රම වාසනා අරමුදල			
2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන්වන වර්ෂය සඳහා			
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය			
		රුපියල්	රුපියල්
		2024	**2023**
ලැබීම්			
ආදායම	*සටහන10*	73,846,574	82,255,039
මුලු ආදායම		**73,846,574**	**82,255,039**
වියදම්			
පරිපාලන වියදම්	*සටහන 11*	16,471,919	15,303,233
ක්ෂයවීම්	*සටහන 12*	3,065,117	3,199,321
අරමුදලේ අරමුණු සඳහා වියදම්	*සටහන 13*	75,636,193	27,829,637
වෙනත් වියදම්	*සටහන 14*	764,143	765,516
		95,937,372	47,097,707
වර්ෂය සඳහා උණතාවය		**(22,090,798)**	**35,157,333**
අනෙකුත් විස්තීර්ණ ආදායම			
ප්‍රත්‍යාගණන ලාභය		3,400,691	-
වසර සඳහා මුළු විස්තීර්ණ උණතාවය		**(18,690,106)**	**35,157,333**

4.3. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

ශ්‍රම වාසනා අරමුදල හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා				
		රුපියල්	රුපියල්	රුපියල්
		ප්‍රත්‍යාගණනය සංචිතය	සමුච්චිත අරමුදල	එකතුව
2022 දෙසැම්බර් 31 දිනට ශේෂය		-	475,784,972	475,784,972
වර්ෂය සඳහා අතිරික්තය			35,157,333	35,157,333
පෙර වර්ෂයේ ගැලපීම	සටහන 15		(394,404)	(394,404)
2024 ජනවාරි 1 වන දිනට ගලපන ලද ශේෂය		-	510,547,900	510,547,900
ප්‍රත්‍යාගණන අතිරික්තය		3,400,691	-	3,400,691
වසර සඳහා ඌණතාවය		-	(22,090,798)	(22,090,798)
2024 දෙසැම්බර් 31 දිනට ශේෂය		**3,400,691**	**488,457,102**	**491,857,794**

4.4. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රම වාසනා අරමුදල		
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	රුපියල්	රුපියල්
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ගලා ඒම	2024	2023
වසර සඳහා ඌණතාවය	(22,090,798)	35,157,333
ගැලපීම		
මුල්‍යමය නොවන වෙනස්වීම්		
ක්ෂයවීම්	2,549,290	2,638,329
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක් ක්ෂය	515,827	560,992
රාජ්‍ය ප්‍රධාන ක්‍රමක් ක්ෂය	(362,500)	(362,500)
පාරිතෝෂික වෙනුවෙන් වෙන්කිරීම්	855,578	116,770
වත්කම් විකිණීමේ ලාභ	(9,417)	(10,795)
ආයෝජන ආදායම්	(10,860,034)	(15,310,603)
ආපදා ණය පොළී	(54,574)	(66,056)
ආයෝජන අදායම් පොළී (Repo)	(1,821,015)	(666,527)
ආයෝජන අදායම් පොළී (Call deposit)	(55,858)	(51,096)
වෙනත් ආදායම්	(535,608)	(87,340)
පරිත්‍යාග	-	(22,225)
රඳවා ගැනීමේ බදු	348,901	
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම		
වෙනත් ගෙවියයුතු දෑ අඩුවීම / වැඩිවීම	123,838	(129,641)
වෙන්කිරීම් අඩුවීම / වැඩිවීම	(114,080)	197,000
තොගයන් අඩුවීම / වැඩිවීම	59,874,401	(31,090,199)
වෙනත් ලැබියයුතු දෑ අඩුවීම / වැඩිවීම	3,066,209	(3,478,443)
කාරක ප්‍රාග්ධනයෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	31,430,160	(12,605,002)
පාරිතෝෂික ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම	31,430,160	(12,605,002)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම		
යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම	(212,482)	(300,727)
තැන්පතු (තැපැල් මුද්‍රණ යන්ත්‍රය)	-	11,180
ආයෝජන පොලී	6,629,113	12,575,055
ආපදා ණය පොලී	54,574	66,056
Repo ආයෝජන පොලී	1,821,015	666,527
වෙනත් ආදායම්	545,402	87,340
තැන්පතු පොලී (Call deposit)	46,063	51,096
පරිත්‍යාග	-	22,225
යන්ත්‍රෝපකරණ විකිණීමෙන් ලැබීම්	16,700	36,500
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ද මුදල් ගලා ඒම	8,900,385	13,215,251
ශුද්ධ වැඩිවීම/(අඩුවීම)මුදල් සහ මුදල් සමාන දෑ	40,330,544	610,249
කාලසීමාව ආරම්භයේ මුදල් සහ මුදල් මුදල් සමාන දෑ	1,531,654	921,405
වසර අවසානයේ මුදල් සහ මුදල් මුදල් සමාන අයිතම	41,862,198	1,531,654

4.5. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

සටහන 01				
දේපළ පිරියත හා උපකරණ				
සටහන -01- 01				
පිරිවැය	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
	2024.01.01 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්/කපා හැරීම්/ගැලපීම	2024.12.31 දිනට ශුද්ධ අගය
වාහන	12,882,500	-	-	12,882,500
යන්ත්‍රෝපකරණ සහ උපකරණ	573,626	101,482	250,625	424,483
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	238,400		105,800	132,600
වායු සමීකරණ	1,118,376		377,376	741,000
පරිගණක	3,886,707	17,000	2,306,802	1,596,905
ගෘහ භාණ්ඩ සහ උපාංග	883,004	94,000	318,704	658,300
කාර්යාල උපකරණ	324,616	-	102,613	222,003
	19,907,229	212,482	3,461,920	16,657,791
සටහන 01-02				
ක්ෂය වීම	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
	2024.01.01 දිනට සමුච්චිත ක්ෂයවීම් ශේෂය	වසර සඳහා ක්ෂය	බැහැර කිරීම්/කපා හැරීම්/ගැලපීම	2024.12.31 දිනට ශුද්ධ අගය
වාහන	8,001,040	1,288,250	-	9,289,290
යන්ත්‍රෝපකරණ සහ උපකරණ	239,649	99,476	316,760	22,365
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	235,284	51,492	277,241	9,536
වායු සමීකරණ	267,041	201,963	426,371	42,633
පරිගණක	3,332,169	805,206	4,022,529	114,846
ගෘහ භාණ්ඩ සහ උපාංග	334,859	80,808	397,373	18,294
කාර්යාල උපකරණ	92,975	22,094	110,279	4,790
	12,503,016	2,549,290	5,550,553	9,501,753
දෙසැම්බර් 31 වන දිනට ලියා හල අගය				7,156,038
සටහන -02	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
අස්පෘශ්‍ය වත්කම්	2024.01.01 දිනට පිරිවැය/ප්‍රත්‍යාගණන ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්/කපා හැරීම්/ගැලපීම	2024.12.31 දිනට ශුද්ධ අගය
මෘදුකාංග				
ගිණුම්කරණ පැකේජය	30,000	-	10,000	20,000
වෙබ් අඩවිය, ISO සහ වෙබ් පාදක පද්ධතිය	2,774,958	-	774,958	2,000,000
	2,804,958			2,020,000
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
ක්‍රමක්ෂය කිරීම	2024.12.01 දිනට සමුච්චිත කමක්ෂය ශේෂය	එකතු කිරීම්	බැහැර කිරීම්/කපා හැරීම්/ගැලපීම	2024.12.31 දිනට ශුද්ධ අගය
මෘදුකාංග				
ගිණුම්කරණ පැකේජය	25,150	5,423	29,423	1,150
වෙබ් අඩවිය, ISO සහ වෙබ් පාදක පද්ධතිය	1,664,975	510,404	2,060,311	115,068
	1,690,125	515,827	2,089,734	116,218
දෙසැම්බර් 31 වන දිනට ලියා හල අගය				1,903,782

සටහන -03		රුපියල්	රුපියල්
		2024	**2023**
මුදල් සහ මුදල් හා සමාන අයිතම			
මහජන බැංකුව -119100103693128		1,827,198	521,654
ලංකා බැංකුව -92953771		25,000	-
මහජන බැංකු විද්‍යුත් කාඩ්පත -119100293693128		10,000	10,000
ස්ථාවර තැන්පතු ආයෝජන		35,000,000	-
ආයෝජන (Call deposit)		5,000,000	1,000,000
		41,862,198	1,531,654
සටහන -04			
ලැබිය යුතු දේ			
භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව		350,765,424	410,397,856
ආපදා ණය		851,200	1,099,457
ආපසු ගෙවිය යුතු තැන්පතු		3,000	3,000
අනෙකුත් ලැබිය යුතු දේ		9,795	3,507
		351,629,419	411,503,820
සටහන -05			
තොගයන්			
තොගය		229,358	177,043
වැඩසටහන් අයිතමය		481,155	3,599,679
		710,513	3,776,722
සාමාන්‍ය බරතබන ලද පිරිවැය මත තොගයන් ගණනය කර ඇත.			
		ගලපන ලද ආරම්භක ශේෂය	
		රුපියල්	රුපියල්
		2024	**2023**
සටහන 06			
2024.01.01 දිනට සමුච්චිත අරමුදල		513,948,592	475,784,872
2024 වර්ෂය සඳහා ඌණතාවය		(22,090,798)	35,157,333
2024.12.31 දිනට සමුච්චිත අරමුදල		491,857,794	510,942,204
සටහන 07			
ගෙවිය යුතු අයිතම			
දුරකථන ගෙවීම්		8,586	10,722
අනෙකුත් ගෙවීම්		47,566	47,108
ජලය සහ විදුලිය ගෙවීම්		314,284	108,901
ශිෂ්‍යත්ව		-	50,000
අතිකාල සහ නිවාඩු වැටුප්		9,287	39,155
		379,723	255,886

සටහන 08			
වෙන් කිරීම්			
නීති ආධාර සඳහා ප්‍රතිපාදන		1,017,000	1,167,000
නීති අභියාචනා		100,000	80,000
නීති ආධාර බේරුම්කරණය		6,000	6,000
විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන		200,000	184,080
		1,323,000	1,437,080
සටහන 09			
ක්ෂය කිරීම			
පහත සඳහන් අනුපාත යටතේ ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර ඇත.			
වාහන		10%	
යන්ත්‍රෝපකරණ		20%	
වායු සමීකරණ		20%	
ශ්‍රව්‍ය දෘශ්‍ය උපාංග		25%	
පරිගණක		25%	
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්		10%	
කාර්යාල උපකරණ		7.5%	
මෘදුකාංග		20%	
වත්කම්වල ක්ෂය කළ හැකි වටිනාකම අවසාන රු. 1 ක වටිනාකමක් දක්වා ක්ෂය කර ඇත.			
සටහන 10		රුපියල්	රුපියල්
		2024	**2023**
ආදායම			
ශ්‍රම වාසනා ලොතරැයි ආදායම		60,147,568	65,688,692
ස්ථාවර තැන්පතු ආයෝජන ආදායම		10,860,034	15,310,603
ආපදා ණය පොලී ආදායම		54,574	66,056
ආදායම (Repo)		1,821,015	666,527
පොලිය (Call Deposit)		55,858	51,096
රජයේ ප්‍රදාන		362,500	362,500
වත්කම් විකිණීමේ ලාභය		9,417	-
පරිත්‍යාග		-	22,225
වෙනත්		535,608	87,340
		73,846,574	82,255,039

සටහන 11			
පරිපාලන වියදම්			
වැටුප් සහ වේතන		5,009,305	6,119,440
සේ.අ. අරමුදල		1,436,497	1,608,400
සේ.භා. අරමුදල		215,475	241,260
ජීවන වියදම් දීමනා		1,598,582	1,279,200
වෙනත් දීමනා		1,680,807	1,438,402
සන්නිවේදන දීමනා		105,867	123,000
සභාපති දීමනා		181,351	225,000
අධ්‍යක්ෂ දීමනා		343,525	462,150
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා		15,000	9,000
අභ්‍යන්තර විගණක දීමනා		-	30,000
වෘත්තීය දීමනා		240,000	240,000
පුහුණු දීමනා		249,000	50,000
ප්‍රසාද දීමනා		-	275,000
පාරිතෝෂික දීමනා		855,578	268,890
සුභසාධනය		148,800	169,000
අතිකාල සහ නිවාඩු වැටුප්		67,984	202,600
ගමන් වියදම්		75,733	60,175
ප්‍රවාහන ගාස්තු		111,000	212,500
ලිපි ද්‍රව්‍ය සහ අනෙකුත්		215,635	233,740
තැපැල් වියදම්		16,190	19,070
දුරකථන වියදම්		93,517	97,696
සංග්‍රහ වියදම්		60,334	55,685
කෙටි ආහාර සහ අනෙකුත්		177,416	154,128
නිවාඩු දින දීමනා		23,819	29,250
අනෙකුත්		47,175	26,181
විගණන ගාස්තු		200,000	180,400
ජලය සහ විදුලිය		767,661	104,786
වෙනත් සේවා		497,073	479,415
නඩත්තු සහ අලුත්වැඩියා වියදම්		1,932,895	769,708
වාහන රක්ෂණය		105,702	118,286
වාර්තා මුද්‍රණය කිරීම		-	20,873
		16,471,919	15,303,233

		රුපියල්	රුපියල්
සටහන 12		**2024**	**2023**
ක්ෂයවීම			
වාහන ක්ෂය		1,288,250	1,288,250
පරිගණක ක්ෂය		805,206	879,914
වායු සමීකරණ ක්ෂය		201,963	197,230
ශ්‍රව්‍ය සහ දෘශ්‍ය දෘශ්‍ය ක්ෂය		51,492	59,600
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් ක්ෂය		80,808	88,300
කාර්යාල උපකරණ ක්ෂය		22,094	24,265
යන්ත්‍රෝපකරණ සහ උපකරණ ක්ෂය		99,476	100,770
මෘදුකාංග සඳහා ක්‍රමක්ෂය		515,827	560,992
		3,065,117	3,199,321

		රුපියල්	රුපියල්
සටහන 13		**2024**	**2023**
අරමුදලේ අරමුණු සපුරා ගැනීම සඳහා වියදම්			
සෞඛ්‍ය කඳවුර		244,466	-
දැනුවත් කිරීමේ වැඩසටහන		319,647	355,146
අධ්‍යාපන ආධාර (විශේෂ)		66,206,553	-
අධ්‍යාපන ආධාර (සාමාන්‍ය)		6,690,848	12,940,367
වෙනත් සුභසාධනය		683,673	1,569,337
නීති ආධාර වැඩසටහන		84,350	968,409
අභියාචනා සඳහා නීති ආධාර		170,000	110,000
බේරුම්කරණය සඳහා නීති ආධාර		-	42,000
ශිෂ්‍යත්ව වැඩසටහන		1,236,656	6,570,800
ආපදා සහන වැඩසටහන		-	4,702,787
තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන		-	80,790
වෛද්‍ය ආධාර වැඩසටහන			490,000
		75,636,193	27,829,637
සටහන 14			
වෙනත් වියදම්			
ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය		415,242	137,085
උ.වි.ගෙ		348,901	628,431
		764,143	765,516
සටහන 15			
පෙර වසරේ ගැලපීම			
කාර්ය මණ්ඩල ගෙවීම් සඳහා ගැලපීම		12,857	
විදුලි බිල්පත් හිඟ		(88,512)	
නීති ආධාර ගැලපීම		20,000	
විගණන ගාස්තු ගැලපීම		(14,080)	
නීති ආධාර අභියාචනා ගැලපීම		(40,000)	
ජල බිල්පත් හිඟ		(6,938)	
පාරිතෝෂික ගැලපීම		(277,731)	
		(394,404)	

සටහන 16

ජංගම ගිණුම

මහජන බැංකුව නාරාහේන්පිට ශාඛාව - "සභාපති ශ්‍රම වාසනා අරමුදල" නමින් ජංගම ගිණුම් දෙකක් සහ ලංකා බැංකුව නාරාහේන්පිට ශාඛාව ජංගම ගිණුම් දෙකක් පවත්වාගෙන යයි.

* මහජන බැංකුවේ ජංගම ගිණුම අංක 119100103693128 අද දින ගනුදෙනු සඳහා පවත්වාගෙන යයි .

* ලංකා බැංකුවේ ජංගම ගිණුම අංක 92953771 ස්ථාවර තැන්පතු පොලී ගනු දෙනු සඳහා පවත්වාගෙන යයි .

*ඉලෙක්ට්‍රොනික හර පතක් සඳහා ජංගම ගිණුම අංක 119100293693128 විවෘත කර ඇත . සීමාව රු. 10,000.00 කි.

සටහන 17

වත්කම් නැවත තක්සේරු කිරීම

2024.09.17 දින වාහන හැර අනෙකුත් සියලුම දේපල, සහ උපකරණ නැවත තක්සේරු කිරීම කර ඇත.

සටහන 18

අසම්භාව්‍ය වගකීම්

1. ශ්‍රම වාසනා අරමුදලේ හිටපු සේවකයෙකු ශ්‍රේෂ්ඨාධිකරණ අංක SC/HC/LA 86/2022 (පර්යන්තයට එරෙහිව) හි නඩුවක් ගොනු කර ඇත
2. ශ්‍රම වාසනා අරමුදලේ සේවකයෙකු විසින් පාරිතෝෂිකය නොගෙවීම සම්බන්ධයෙන් බොරැල්ල කම්කරු අධිකරණයේ නඩුවක් ගොනු කර ඇති අතර එය විභාග වෙමින් පවතී. නඩු අංක 13/37/2024

සටහන 19

රඳවා ගැනීමේ බද්ද

පවතින බදු රෙගුලාසිවලට අනුව, ශ්‍රම වාසනා අරමුදල ස්ථාවර තැන්පතු පොලියෙන් ලැබෙන ආදායම මත රඳවා ගැනීමේ ගෙවීමට බැඳී සිටි.

සටහන 20

වසරේ ඌණතාවය

2024 වර්ෂයේ සමස්ථ ලොතරැයි ආදායම රුපියල් මිලියන 60 ක් වූ අතර . වර්ෂය සඳහා ක්‍රියාත්මක කල (විශේෂ ව්‍යාපෘතිය ද ඇතුලත්ව) අනෙකුත් අරමුණු වෙනුවෙන් රුපියල් මිලියන 119.78 ක් ලබා දෙන ලදී. ඒ අනුව 2024 අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලින් ඌණතාවය තාවයක් පෙන්නුම් කෙරේ.

සටහන 21

රජයේ ප්‍රදාන

රජයේ ප්‍රදානයක් ලෙස සටහන් කර ඇති වත්කම් එහි වටිනාකමෙන් 10% ක අනුපාතයකින් ක්‍රමක්ෂය කරන ලදී.

සටහන 22

සංසන්දනාත්මක තොරතුරු

මෙම වසරේ තොරතුරු තහවුරු කිරීම සඳහා අවශ්‍ය තැන්වලදී පෙර වසරේ සංඛ්‍යා නැවත දක්වා ඇත.

සටහන 23

කොන්ත්‍රාත්තු සඳහා අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

මණ්ඩලයේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කිසිදු අධ්‍යක්ෂවරයෙකුට ඍජු හෝ වක්‍ර සම්බන්ධයක් නොමැත.

සටහන 24

අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම ශ්‍රම වාසනා අරමුදලේ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය දරනු ලබයි.

පස්වන පරිච්ඡේදය

5.1 ගිණුම්කරණ ප්‍රතිපත්තිය

1. පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති.

1.1 වාර්තා කරණ ඒකකය.

ශ්‍රම වාසනා අරමුදල 1998 අංක 12 දරණ ශ්‍රම වාසනා අරමුදල් පනත හා 2019 අංක 15 දරණ ශ්‍රම වාසනා අරමුදල් (සංශෝධන) පනත මගින් සංස්ථාගත කර ඇත.

1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය.

2025 පෙබරවාරි මස 25 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

1.3 වාර්තාකරණ කාලපරිච්ඡේදය.

ශ්‍රම වාසනා අරමුදලේ මූල්‍ය කාලපරිච්ඡේදය 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් මස 31 වන දින දක්වා මාස 12 ක කාලපරිච්ඡේදය නියෝජනය කරයි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.4.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශන වලට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය ප්‍රකාශ වලට සටහන් ඇතුලත් වේ. මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම මත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS'S) අනුකූල ව පිළියෙල කොට ඉදිරිපත් කර ඇත.

1.4.2 මිනුම් කිරීමේ පදනම

වත්කම් නැවත ඇගයීම සඳහා ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මෙම ගිණුම් වලට බලපාන උද්ධමනකාරී සාධකයන් ගණනය කොට නැත.

1.4.3 සංසන්දනාත්මක තොරතුරු

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීමට අනුකූලතාවය දැක්වීම සඳහා ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළු සංසන්දනාත්මක තොරතුරු මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හා සැසඳිය හැකි වන පරිදි මූල්‍ය ප්‍රකාශ තුලින් වාර්තා කර ඇති සියලුම වටිනාකම් පෙර වර්ෂ වලට අනුව හෙළිදරව් කිරීම් කර ඇත. අවශ්‍ය අවස්ථාවලදී වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීමට සංසන්දනාත්මක සංඛ්‍යා සංශෝධනය කර ඇත.

1.4.4 ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

ශ්‍රම වාසනා අරමුදලේ ව්‍යවහාරික හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වටිනාකමෙන් මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

1.4.5 ගිණුම්කරණ ඇස්තමේන්තු විනිශ්චයන් හා භාවිතය

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී සහ ඇතැම් ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදී විනිශ්චයන් ,තීන්දු තීරණ හා උපකල්පන භාවිතයට ගැනීම අවශ්‍යය වන අතර

ඒවායේ ඇති අවිනිශ්චිතභාවය නිසා අනාගත කාලසීමා සඳහා ඉදිරියට ගෙනයනු ලබන ශේෂයන්ගේ සුවිශේෂී ගැලපුම් සිදු කිරීමේ අවශ්‍යතාවය පැන නැගීමට ඉඩ ඇත.

ශ්‍රම වාසනා අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේ ක්‍රියා වලියේ දී මූල්‍ය ප්‍රකාශන වලට සුවිශේෂී බලපෑමක් විය හැකි පහත දැක්වෙන තීරණ නිශ්චය කිරීම් සහ උපකල්පන කළමණාකාරීත්වය විසින් සිදු කර ඇත.

අ) දේපල පිරියත හා උපකරණ වල ඵලදායී ජීව කාලය

වත්කමේ ඵලදායී ජීව කාලය , ක්ෂය කිරීමේ ක්‍රම වේදය හොදම ඇස්තමේන්තුව මත පදනම්ව කළමණාකරණය විසින් තීරණය කරනු ලබන අතර එම නිසාම ඒවා අවිනිශ්චිතතාවයෙන් යුක්ත වේ.
ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්වල යම් වෙනස්කම් මූල්‍ය වාර්තා වලට අදාල සටහන් තුල හෙළිදරව් කර ඇත.

ආ) අඛණ්ඩ පැවැත්ම

ශ්‍රම වාසනා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අවිනිශ්චිතතාවයක් ඇති වන සැලකිය යුතු කිසිවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් හඳුනා ගෙන නොමැති නිසා අරමුදලේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වේ. මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්ම පදනමක් මත වන අතර ගිණුම්කරණ ප්‍රතිපත්ති එම කාලය පුරාම ක්‍රියාත්මක වේ.

1.5 වත්කම් හා වත්කම් තක්සේරු කිරීමේ පදනම

1.5.1 දේපල පිරියත හා උපකරණ (PPE)

අ) හඳුනාගැනීම හා මිනුම්ගත කිරීම

දේපල පිරියත හා උපකරණ ඒවායේ අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය සතු වන්නේ දැයි හෝ එහි පිරිවැය දේපල පිරියත හා උපකරණ පිළිබඳ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුකූලව විශ්වාසදායී ලෙස මැනිය හැකි දැයි යන්න මත ඒවායේ ධාරණ අගය විනිශ්චය කිරීම හා ක්ෂය කිරීම හා ඒවාට අදාල හානිකරණ අලාභ හඳුනා ගනු ලැබේ. මූලික අදියරේ දී දේපල පිරියත හා උපකරණ එහි පිරිවැයට තක්සේරු කරනු ලබයි.

ආ) පිරිවැය

දේපල පිරියත හා උපකරණ වල පිරිවැය එහි මිලදී ගැණුම් පිරිවැය සහ එහි අදහස් කරන භාවිතය සහ කාර්යය මට්ටමට සෘජුවම දායක විය හැකි යම් පිරිවැය ඇතුලත් වේ. දේපල පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කල පසු ලැබෙන පිරිවැයට දක්වනු ලැබේ. ත්‍යාග වශයෙන් අරමුදලට ලද ලද වත්කම් රාජ්‍ය ප්‍රධාන ගිණුමට බැර කර දේපල පිරියත හා උපකරණ ගිණුමට හර කර ඇත.

ඇ). පසුකාලීන වියදම්

වත්කම් වල ඉපැයීමේ ධාරිතාව පවත්වා ගෙන යාම හෝ වැඩි කිරීම සඳහා ස්ථිර ස්වභාවයේ වත්කම් අත්පත් කරගැනීම,ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීමේ අරමුණ සඳහා දැරූ පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සැලකේ.

ඇ). ක්‍ෂය වීම්

ඉඩම් හැර සෙසු වත්කම් ක්‍ෂය කිරීමේදී දේපල පිරියත හා උපකරණ අයිතම වල එක් එක් කොටස්වල ජීවිත කාලය පුරා සරල රේඛීය ක්‍රමයට ක්‍ෂය කරනු ලැබේ.
වත්කම් භාවිතයට ගන්නා අවස්ථාවේ සිට එය ඉවත් කරන දිනය දක්වාම ක්‍ෂය කිරීම සිදු කරනු ලැබේ.

පහත ක්‍ෂය අනුපාත යටතේ ක්‍ෂය කරන ලදී.

වාහන	10%
යන්ත්‍රෝපකරණ	20%
වායුසමීකරණ	20%
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ	25%
පරිගණක	25%
ලී බඩු සහ සවිකිරීම්	10%
කාර්යාල උපකරණ	7.5%
මෘදු කාංග	20%

ඉ). අස්පෘශ්‍ය වත්කම්
අස්පෘශ්‍ය වත්කම් යනු මූල්‍ය වටිනාකමක් සහිත භෞතික නොවන වත්කම් වේ.

ඊ). හඳුනාගැනීමේ පදනම

වත්කමක පිරිවැයට වඩා විශ්වාසවන්තව මැනිය හැකි මෙන්ම එම වත්කම අනාගත අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරය තුලට ගලා එන්නා වූ භෞතික පැවැත්මක් නොමැති වත්කම් මේ යටතේ හඳුනා ගැනේ.

•. ගිණුම්කරණ මෘදුකාංග

ආයතනය විසින් මිලදී ගන්නා ලද ගිණුම්කරණ මෘදුකාංග අත්පත් කර ගැනීමේ පිරිවැය මත මිනුම් කිරීම සිදු කරන අතර,පිරිවැයෙන් සමුච්චිත ක්‍රම ක්‍ෂය කපා හැරීම සිදු කරයි.

උ) අස්පෘශ්‍ය වත්කම් ක්‍ෂය
වත්කම භාවිතයට ගත් දිනයේ සිට වත්කම් ඵලදායී ජීවිත කාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්‍රම ක්‍ෂය කිරීමෙන් ආදායම් ප්‍රකාශනයට ගැලපීම සිදු කරයි.

ඌ). වත්කම් ප්‍රත්‍යාගණනය.
ප්‍රත්‍යාගණනය රජයේ පිළිගත් ඒ පිළිබඳ වෘත්තීය සුදුසුකම් ලත් පුද්ගලයෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් වාහන හැර අනෙකුත් සියලුම දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය (SLAPS 07) සිදු කර ඇත.

වාහන නැවත තක්සේරු කිරීම සඳහා සුදුසු කමිටුවක් පත් කර නැවත ඇගයීම සිදු කර 2025 මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට නියමිතව ඇත.

සියලුම නව ප්‍රත්‍යාගණන අගයන් වත්මන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනයේ ඉදිරිපත් කර ඇත. ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතය වෙත මාරු කර ඇති අතර මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සමුච්චිත අරමුදලට සහ සංචිතයට ඇතුළත් කර ඇත.

එ). ඉවත් කිරීම

දේපල පිරියත හා උපකරණ පවත්නා වටිනාකම ඒවා විකිණීමේදී හෝ එමගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ නොලැබෙන අවස්ථා වලදී ඉවත් කිරීම සඳහා හඳුනා ගැනේ. ප්‍රාග්ධන අයිතම බැහැර කිරීම ශ්‍රී ගිණුම්කරණ ප්‍රමිත (SLAPS 07)අනුව ගිණුම් ගත කර ඇත.

1.5.2 තොගය

තොගය පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ප්‍රකාශ කෙරේ. තොගය බර තැබූ සාමාන්‍ය පිරිවැය මත නිකුත් කිරීම සිදු කර ඇත.

1.5.3 ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් එක්රැස් කරගත නොහැකි සියලුම වටිනාකම් සඳහා වන සියලුම බිල්පත් වල වටිනාකම වේ. ලැබිය යුතුගිණුම් ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් සහ ස්ථාවර තැන්පතු වලින් ලැබිය යුතු පොළිය වේ.

අ) භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදලට ලැබිය යුතු ප්‍රධාන ආදායම් ප්‍රභවය “Lucky 07” ලොතරැයි අලෙවිය මගින් ලැබෙන අලෙවි ආදායමෙන් 10% ආයකත්ව දැක්විය හැක. සෑම මසකම එසේ ලැබෙන ලොතරැයි ආදායම ලොතරැයි මණ්ඩලය මගින් ඒකාබද්ධ අරමුදලට බැර කෙරෙන අතර අරමුදලේ වාර්ෂික අවශ්‍යතාවට අනුව කාර්තු වශයෙන් මුදල් නිකුත් කෙරේ. ඒකාබද්ධ අරමුදල තුල ශ්‍රම වාසනා අරමුදල නමින් අරමුදලට ලැබිය යුතුව ඇති මුදල මෙමගින් නිරූපනය වේ.

ආ) ස්ථාවර තැන්පතු ලැබිය යුතු මුදල්

ශ්‍රම වාසනා අරමුදල නමින් රාජ්‍ය බැංකු හතරක පවත්වා ගෙන යනු ලබන ස්ථාවර තැන්පතු මගින් වර්ෂයට අදාලව ලැබිය යුතු තිබුව තිබු නමුත් මෙතෙක් නොලැබු මුදල් වේ.

1.5.4 ආයෝජන

ආයෝජන වසරකට වඩා අඩු කාලයක් සඳහා වු කෙටිකාලීන ආයෝජන සහ වසරකට වඩා වැඩි කාලයක් සඳහා වු දිගුකාලීන ආයෝජන වලින් යුක්ත වේ. මාස තුන මාස හය සහ අවුරුද්දක කාලයක් සඳහා ස්ථාවර තැන්පතු වල සිදු කරන ලද කෙටිකාලීන ආයෝජනයන්ද ශ්‍රම වාසනා අරමුදලේ වෙබ් අඩවිය සහ පරිඝණක ගත තොරතුරු පද්ධතිය සහ තත්ත්ව සහතිකය ලබා ගැනීම තෙක් සිදු කරන ලද දිගුකාලීන ආයෝජනයන් ද නිරූපනය වේ.

1.5.5 මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් හා මුදල් හා සමාන අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ.

1.6 වගකීම් සහ වෙන්කිරීම්

ශේෂ පත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මුල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂ පත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කල නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීම් සිදු කොට ඇත. මුල්‍ය තත්ව ප්‍රකාශයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැදීම් මුල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ.මුල්‍ය තත්ව ප්‍රකාශයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මුල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

1.6.1 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් හා ප්‍රතිපාදන

ඈ) පාරිතෝෂික ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම
1983 අංක 12 හි පාරිතෝෂික පනත ට අනුව ශ්‍රම වාසනා අරමුදල පාරිතෝෂික ගෙවීමට බැදී සිටී.ඒ සදහා ගණනය කරන ලද වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනය තුල නිරූපනය කෙරේ.

ආ) දායක සැලසුම් අර්ථ දැක්වීම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල - සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා සුදුසුකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව අදාළ දායක අරමුදල් මගින් ආවරණය කෙරේ.

සේවකයාගේ මූලු වේතනයෙන් සේවක අර්ථසාධක අරමුදල් දායකත්වය සඳහා 12% ක් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වය සඳහා 3% ක් අරමුදල විසින් දායක කරනු ලැබේ.

ඇ) නීති ආධාර ලබා දීම් සඳහා වෙන් කිරීම

ශ්‍රම වාසනා අරමුදලේ එක් අරමුණක් වන නීති ආධාර ලබා දීමේදී නඩුව විභාග වන අතර තුර පළමු නීති ආධාර වාරික මුදල් ලබා දෙන අතර දෙවන වාරික මුදල් නඩු වේ නියෝගය ලැබුණු පසු ලබා දීම සිදුවේ. වර්ෂය තුලදී අවසන් නියෝගය නොලද නඩු සඳහා මෙම වෙන් කිරීම් සිදු කර ඇත.

1.7 අසම්භාව්‍ය වියදම්.

සේවයෙන් පහ කරන ලද සේවකයකු විසින් ශ්‍රම වසනා අරමුදලට එරෙහිව උපරිමාධිකරණයෙහි අංක SC/HC/LA/86/2022 දරන නඩුවක් ගොණු කර ඇත.

1.8 මූල්‍ය කාර්යසාධන වාර්තාව.

1.8.1 ආදායම/අයභාරය

වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ලැබීම් ස්වභාවයේ හෝ ශුද්ධ වත්කම් / ස්කන්ධයේ වැඩි වීමේ ප්‍රතිඵලයක් සේ ලැබෙන ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවන්හි දළ ගලා යාමකි. ආදායම හා පොළී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන අතර ආදායමෙහි ජාතික සම්පත ලොතරැයි ආදායම,ස්ථාවර තැන්පතු පොළී ආදායම ප්‍රධාන වේ.

1.8.2 වියදම
වාර්තාකරණ කාලපරිච්ඡේදය තුලදී ගලායෑම් ස්වාභාවයෙන් හෝ වත්කම් පරිභෝජන ස්වාභාවයෙන් හෝ බැරකම් ඇතිවීමේ ස්වාභාවයෙන් සිදුවන ආර්ථික ප්‍රතිලාභයන්ගේ හෝ සේවා ශක්‍යතාවයන්ගේ අඩු වීමකි. ශ්‍රම වාසනා අරමුදලේ කටයුතු පවත්වා ගෙන යාම ,අරමුදලේ අරමුණු ඉටුකර ගැනීම සහ ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන ප්‍රාග්ධන සහ අයභාර ස්වභාවයේ සියලුම දෑ වේ.

1.9 ශේෂ පත්‍ර දිනට පසු සිදු වීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන වැදගත් ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගෙන මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය ගැලපීම් සහ අනාවරණයන් සිදු කිරීමට කටයුතු කර ඇත.

1.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) අනුකූලව "වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහය සකස් කර ඇත.

5.2 විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/SVF/SR/01/2024   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2025 මැයි 29 දින

සභාපති

ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාවමේ සමඟ එවා ඇත.

ජී.එච්.ඩී.ධර්මපාල,
විගණකාධිපති (වැ.බ)

පිටපත : 1.ලේකම්, කම්කරු අමාත්‍යාංශය.
2. ලේකම්, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/SVF/SR/01/2024 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 29 දින

සභාපති
ශ්‍රම වාසනා අරමුදල

ශ්‍රම වාසනා අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රම වාසනා අරමුදලේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවින් බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය හා කාර්යය	**නිරීක්ෂණ**
	2019 අංක 15 දරන ශ්‍රම වාසනා අරමුදල (සංශෝධන) පනතින් සංශෝධිත 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනත	
(i)	3.3 උප වගන්තිය හා 3.4 (2)(උ) උප වගන්තිය	පනතේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයට, එහි රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල කටයුතු කරන ආකාරය විධිමත් කර ගැනීම සම්බන්ධව රීති සෑදීමට බලය ලබා දී තිබුණද සමලෝචිත වර්ෂය අවසාන වන විටත් එම රීති පිළියෙල කර නොතිබුණි. කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු විනිශ්චය සභාව, බේරුම්කරුවෙකු , කම්කරු උසාවිය හෝ යම් අධිකරණයක් ඉදිරියේ ඇති නඩු කටයුතු සඳහා සේවා නියුක්තිකයන්ට නීතිමය සහාය ලබාගැනීමට, මූල්‍යමය සහන සැලසීමට තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් මුදල් ප්‍රමාණයකට යටත් විය යුතු වුවත් ඊට අදාල රීති පිළියෙල කර නොතිබුණි.

3

(ii) 14 .1 උප වගන්තිය

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කෙරෙහි බලපවත්වන හෝ ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය යැයි මණ්ඩලය සලකන රීති හෝ පනත මගින් රීති සෑදීමේදී බලය දී ඇති හෝ රීති සෑදීම අවශ්‍ය යැයි සලකන කාරණා සඳහා රීති මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එබඳු රීති පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

(iii) 6 (ආ) වගන්තිය

සේවා නියුක්තිකයන්ගේ සේවයේ යෙදී සිටි ආයතන පූර්ව දැනුම්දීමකින් තොරව වසා දැමුනු අවස්ථාවක ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීමට අදියර 3 ක් යටතේ රු.මිලියන 1.33 ක් වෙන් කර තාක්ෂණික අධ්‍යාපන වැඩසටහන් 11 ක් ඇතුළු වැඩසටහන් සැලසුම් කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි.

(IV) 6 (ඊ) වගන්තිය

සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය සඳහා විශේෂ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම සිදුකල යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුණු උදෙසා කිසිදු කාර්යයක් ඉටුකර නොතිබුණි.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 ප්‍රකාරව ප්‍රසම්පාදනයේ මූලික අරමුණුවල උපරිම ආර්ථිකභාවය, ප්‍රමිතිය හා කාර්යක්ෂමතාවය ළඟා කර ගැනීම ප්‍රසම්පාදන අස්ථිත්වයේ වගකීම වුවද, සැලසුම් කිරීමකින් තොරව අවස්ථා 5 ක දී එකතු වටිනාකම රු.මිලියන 56.17 ක් වූ පාසල් බෑග් සහ පොත් මිලදී ගැනීම හේතුවෙන් රජයට ලබාගත හැකිව තිබූ උපරිම වාසිය අත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අරමුදලේ එක් අරමුණක් වූ අධ්‍යාපන ආධාර ලබාදීමේ වැඩසටහන වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 14.4 හා සුබසාධන වැඩසටහන් වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 2.5 ද ඇතුළුව රු.මිලියන 16.9 ක් යොදාගෙන පාසල් පොත් හා බෑග් බෙදාහැරීමේ වැඩසටහන් දියත්කර තිබූ අතර මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙනතුරු අරමුදලේ ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු මුදලින් රු.මිලියන 5 ක් ද, වර්ෂයේ පළමු කාර්තුව වෙනුවෙන් අරමුදල වෙත ලැබී තිබූ රු.මිලියන 7.2 ක්ද වූ මූල්‍යමය ප්‍රතිපාදන හා සැලසුම් පූර්ව අනුමත කරගැනීමකින් තොරව භාවිතා කර තිබුණි.

(ඇ) පාසල් උපකරණ බෙදාදීමේ ව්‍යාපෘතිය සඳහා බෙදාහරින ලද උපකරණවල පිරිවැය තුල ඊට සහභාගි වූ නිලධාරීන්ගේ ආහාර, නවාතැන්, ඉන්ධන, අතිරේක කාර්යමණ්ඩල පිරිවැය හා නිවාඩු දින වැටුප යනාදී අමතර පිරිවැය රු.මිලියන 10.86 ක් දරා තිබුණි. ඒ අනුව අඩු පිරිවැයක් යටතේ භාණ්ඩ බෙදාහැරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබීම හේතුවෙන් ඒ සඳහා මුළු පිරිවැයෙන් පරිපාලන වියදම් සඳහා සියයට 20 ක් පමණ දැරීමට සිදුව තිබුණි.

(ඈ) අවශ්‍ය පාසල් බෑග් සහ පොත් ලබාගැනීම හා ඇසුරුම් කිරීම, වරින් වර දිවයින පුරා බෙදාහැරීම 2024 පෙබරවාරි සිට ක්‍රියාත්මකව පැවති අතර ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් නොමැතිවීම නිසා නිසි අභ්‍යන්තර පාලනයක් හා අධීක්ෂණයක් පැවති බව නිරීක්ෂණය නොවූ අතර, ආයතනය විසින් කරන ලද

4

පාසල් උපකරණ ඇනවුම් කට්ටල හා දිස්ත්‍රික්ක සඳහා ලැබී තිබූ ඇනවුම් කට්ටල අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

2.3 වෙනත් කරුණු

(අ) ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගේ යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් ප්‍රතිලාභ සැපයීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනට හා ආපදා සහන වැඩසටහනට රු.මිලියන 8 ක් වෙන් කර තිබුණද, සැලසුම් කර තිබූ ශිෂ්‍යත්ව 100 න් ශිෂ්‍යත්ව 9 ක් පමණක් ලබා දී තිබූ අතර මේ සඳහා රු.මිලියන 0.47 ක් වැය කර තිබුණි. ඒ අනුව අදාල අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) 2024 වර්ෂයේ ජූලි මාසය දක්වා විශේෂ වැඩසටහන් සඳහා දැඩි අවධානයක් යොමුකිරීම සහ ක්‍රියාකාරී සැලැස්මෙහි සංශෝධනයන් හේතුවෙන් රු.මිලියන 6.83 ක් සහිතව සැලසුම්කර තිබූ වැඩසටහන් 9 ක් ඉටුකර නොතිබුණි. දැනුවත් කිරීමේ වැඩසටහන්, මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන, නීති අධාර හා වෛද්‍ය ආධාර වැඩසටහන් සඳහා වෙන්කල රු.මිලියන 28.15 ක මුදලින් අදාල කාර්යසාධන මට්ටමට ලඟා වීම සියයට 13 – 40 ක මට්ටමක පැවතුනි.

(ඇ) සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා 2024 වර්ෂයේදී සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි විශේෂ වැඩසටහන් 25 හැර ඉතිරි නීති ආධාර වැඩසටහන් 50 ක් හා නීති සහය සැපයීමේ වැඩසටහන් 20 සඳහා වෙන් කල රු.මිලියන 1.85 ක මුදලින් රු.මිලියන 0.39 ක් වැය කර නීති ආධාර වැඩසටහන් 6 ක් සහ නීති සහය වැඩසටහන් 3 ක් පමණක් පවත්වා තිබුණි.

(ඈ) හදිසි අවස්ථාවකදී සේවා නියුක්තිකයන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම සිදු කිරීම සඳහා 2024 වර්ෂයේදී රු.මිලියන 1.45 ක් වෙන් කර තිබුණද ඒ සඳහා කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොතිබුණි.

ජී.එච්.ඩී.ධර්මපාල,
විගණකාධිපති (වැ.බ)

හයවන පරිච්ඡේදය

6.1. 2024 විගණකාධිපති වාර්තාව පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය.

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල සමාලෝචනය පහත දැක්වේ.

2.2.1.

(i) 3.3 උප වගන්තිය හා 3.4 (2)(උ) උප වගන්තිය.

2020 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පැවති කාලයේදී රීති සාදා නීති කෙටුම්පත් සම්පාදක වෙත යැවූ අතර අමාත්‍යාංශය වෙනස් වීම මත එය ක්‍රියාත්මක නොවුනි.

2022 වර්ෂයේ කම්කරු අමාත්‍යාංශය යටතේ රීති සකස් කිරීම සහ පනත සංශෝධනය යන දෙකම එකවර සිදු කිරීමට අවශ්‍ය වූ නිසා යම් කාලයක් ගත විය. නමුත් මේ වන විට රීති කෙටුම්පත් සකස් කර අවසන්ව ඇත. සකස් කරන ලද කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතය.

(ii) 14.1. උප වගන්තිය

2020 වර්ෂයේ ශ්‍රම වාසනා අරමුදල, මුදල් අමාත්‍යාංශය යටතේ පැවති අතර රීති සාදා නීති කෙටුම්පත් සම්පාදක වෙත යවන ලදී. අමාත්‍යාංශය වෙනස් වීම මත එය ක්‍රියාත්මක නොවුනි.
නැවත 2022 වර්ෂයේ කම්කරු අමාත්‍යාංශය යටතේ රීති සකස් කිරීම සහ පනත සංශෝධනය යන දෙකම එකවර සිදු කිරීමට අවශ්‍ය වූ නිසා යම් කාලයක් ගත විය. නමුත් මේ වන විට රීති කෙටුම්පත් සකස් කර අවසන්ව ඇත. සකස් කරන ලද කෙටුම්පත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතය.

(iii) 6 (ආ) වගන්තිය

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය අවසන් කිරීමේ අංශය මගින් පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ ආයතන හා එහි සේවා නියුක්තිකයන් පිළිබඳ තොරතුරු ලබා දේ. එසේ එවනු ලබන ප්‍රතිලාභීන් වෙත තාක්ෂණික ආධාර ලබා දීමට සැලසුම් කර අදාළ අයදුම්පත් ඇතුලත් ලිපි යොමු කර තිබුණද ඒ සඳහා ඔවුන්ගේ ප්‍රතිචාරයක් නොලැබුණි.

(iv) 6 (ඊ) වගන්තිය

ශ්‍රම වාසනා අරමුදලේ පස් අවුරුදු සංයුක්ත සැලැස්මට අනුව අරමුදල වෙත ලැබෙන ආදායම හා අනෙකුත් කරුණු සැලකිල්ලට ගනිමින් එක් එක් වර්ෂයන් සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරනු ලැබේ.
සෑම වසරකම සේවා නියුක්තියන්ගේ සුබසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන් සඳහා වූ වැඩසටහන සිදු නොවන අතර පස් අවුරුදු සැලැස්මෙහි එක් වරක් පමණක් මෙම වැඩසටහන සිදු කරනු ලැබේ. ඒ අනුව 2021 සිට 2025 සංයුක්ත සැලැස්මට අනුව 2021 වර්ෂයේදී මෙම වැඩසටහන සිදු කර ඇත.

2.2.2.

(අ).

2024 වර්ෂයට අදාල අයවැය ලේඛණය, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම 2023.07.31 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ගන්නා විට මෙම වැඩසටහන හඳුනාගෙන නොතිබූ වැඩසටහනක් විය.
2024 ජනවාරි මස පැවති අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී මෙම වැඩසටහනට අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව සැලසුම් අනුමත කර ප්‍රතිපාදන අනුමත කර ගැනීම සහ එකවර ප්‍රසම්පාධන සිදු කිරීමට ප්‍රමාණවත් මුදල් නොමැති වීම මත භාණ්ඩාගාරයෙන් නිදහස් කරන මුදල් ප්‍රමාණයන් අනුව වරින් වර ප්‍රසම්පාදනය සිදු කරන ලදී.

(ආ)

2023.07.31 දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අයවැය ලේඛණය, ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්මට අනුව අධ්‍යාපනික ආධාර ලබා දීමේ වැඩසටහන සඳහා රු.මිලියන 3.5ක් වෙන් කර තිබුණි. ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් අධ්‍යාපනික ආධාර ලබා දීමේ වැය ඇස්තමේන්තුව රු.මිලියන 3.5 සිට රු.මිලියන 16.9 දක්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අනුමත අය වැය ඇස්තමේන්තු අතර මාරු කර, මෙම වැඩසටහන 2024 සංයුක්ත සැලැස්මට ඇතුලත්ව තිබූ අධ්‍යාපන ආධාර වැඩසටහන යටතේ ආරම්භ කරන ලදී.
ඒ අනුව අයවැය ලේඛණය තුල අරමුදලේ පළමුවන අරමුණ ඉටු කිරීම වෙනුවෙන් රු.මි. 19.7 ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ සඳහා අරමුදලේ පළමු කාර්තුව වෙනුවෙන් අධ්‍යාපන ආධාර සඳහා ලබා දුන් රු.මි.7.2 ක මුදල සහ කල්පිරුණු ස්ථාවර තැන්පතු රු.මි. 5 ක මුදලද යොදා ගත් අතර එම මුදල් ඒ සඳහා යොදා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

(ඇ)

මෙම වැඩසටහන වෙනුවෙන් දැරිය යුතු අත්‍යාවශය වියදම් පමණක් දරා ඇති අතර ඉන් 75%ක් පමණ මෙම වැඩසටහනෙහි මූලික වියදම් (ප්‍රතිලාභීන්ගේ ආහාර පාන, ප්‍රතිලාභීන්ගේ ප්‍රවාහන වියදම්, උපකරණ කට්ටල ප්‍රවාහන වියදම්, හා ප්‍රසම්පාදන වියදම්) සඳහා වන අතර මෙම වියදම් අමතරව දරා ඇති වියදමක් නොවනු ඇත.

විගණනය විසින් පෙන්වා ඇති රුපියල් මිලියන 10.86 න් 25% ක් පමණ එනම් රුපියල් මිලියන 2.7 ක් වැඩසටහන සම්බන්දයෙන් වූ පරිපාලන වියදම් වෙනුවෙන් දරා ඇත.

(ඈ)

ශ්‍රම වාසනා අරමුදල එක් එක් දිස්ත්‍රික්ක වෙනුවෙන් අවශ්‍ය වූ පාසැල් බෑග් සහ පොත් කට්ටල ප්‍රමාණයන් පමණක් ඇණවුම් කල අතර, කලින් පාසල් බෑග් බෙදා දුන් දිස්ත්‍රික්කවලින් ඉතිරිවූ පාසැල් බෑග් සහ පොත් ඊළඟ දිස්ත්‍රික්ක සඳහා යොදා ගැනීම සිදු කරන ලදී.
මෙම නිසා සමහර දිස්ත්‍රික්ක සඳහා ඇනවුම් කල උපකරණ කට්ටල හා ලබා ගත් උපකරණ කට්ටල ප්‍රමාණයන් අතර වෙනසක් ඇති විය.

2.3. වෙනත් කරුණු.

(අ)

ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් නොසිටීම හා විශේෂයෙන් රට තුල මැතිවරණ කාලසීමා දෙකක් ක්‍රියාත්මක වීමත් හේතුවෙන් 2024 වර්ෂය තුල සැලසුම්කල ඉලක්ක සපුරාගත නොහැකි විය.

(ආ)

විගණන විමසුමේ සඳහන් සැලසුම් කර ඉටු නොකළ වැඩසටහන් වැය රු.මි.5.33 ක් වේ. විශේෂයෙන් රට තුල මැතිවරණ කාලසීමා දෙකක් ක්‍රියාත්මක වීමත් හේතුවෙන් සමහර වැඩසටහන් සිදු කිරීමට නොහැකි විය.

(ඇ)

නීති ආධාර වැඩසටහන් 06ක් සහ නීති සහය (අභියාචනා) ලබා දීමේ වැඩසටහන් 03ක් සිදු කර ඇත. ප්‍රතිලාභ කමිටුව මඟින් ප්‍රතිලාභීන් හඳුනා ගත්ත ද අධ්‍යක්ෂ මණ්ඩලයක් එම කාලවකවානුව තුළ නොතිබුනු බැවින් ප්‍රතිලාභී ලේඛන අනුමත කර ගැනීමට නොහැකි විය.

(ඇ)

විගණන වාර්තාවේ වැඩසටහන වෙනුවෙන් දක්වා ඇති වෙන්කිරීම රු.මිලියන 1.45 නොවන අතර එය රු. මිලියන 0.75 වේ. වෛද්‍ය අධාර හා වෙනත් පහසුකම් සලසා දීම සඳහා ප්‍රතිලාභීන් 2024 වර්ෂය තුල දී හඳුනාගත් අතර අගොස්තු මාසයෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් නොතිබුන හෙයින් අනුමත කර ගත නොහැකි විය.

6.2 ශ්‍රම වාසනා අරමුදල ඇවර කිරීම පිලිබඳ හෙළිදරව් කිරීම.

රජයේ ප්‍රතිපත්තිමය තීරණයකට අනුව ***"රජයට අයත් වාණිජමය නොවන ආයතන පිළිබඳ සමාලෝචන වාර්තාව ඉදිරිපත් කිරීම"*** මැයෙන් 2025.03.25 වන දින අංක අමප/25/0288/802/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණයෙහි අංක **4.9** යටතේ ***"කළමනාකරණය සඳහා රජයේ මැදිහත්වීම ඉවත් කල යුතු සහ ඇවර කල යුතු ආයතන"*** යටතේ අදාල වාර්තාවේ **32** පිටුවේ වගුව **12** හි අංක **2** හි පහත සඳහන් ලෙස දක්වා ඇත.

අමාත්‍යාංශය.	-	*කම්කරු අමාත්‍යාංශය,*
ආයතනය	-	*ශ්‍රම වාසනා අරමුදල,*
කමිටු නිර්දේශය	-	*මෙම ආයතනය තවදුරටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නිරීක්ෂණය නොවන බැවින් දැනට එහි සේවාවන්ගෙන් ප්‍රතිලාභ ලබන පාර්ශවයන්ට අගතියක් නොවන පරිදි ආයතනය ඇවර කිරීම.*

ඉහත නිර්දේශය අනුව මේ වනවිට ශ්‍රම වාසනා අරමුදල ඇවර කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී.

මෙම තත්වය මත ශ්‍රම වාසනා අරමුදල 2024 වර්ෂයට අදාල අවසාන ගිණුම් පිළියෙළ කිරීමේ දී සලකා බලන ලද අඛණ්ඩ පැවැත්ම පිලිබඳ මූලික ගිණුම්කරණ සංකල්පය මේ වන විට බැහැර වී ඇති අතර ඒ පිලිබඳ අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

7. ඇමුණුම්

7.1 දැනුවත් කිරීමේ වැඩසටහන්

- 2024.03.15 පොල්ගස්ඕවිට Metrix Product pvt ltd, ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 16ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- 2024.04.05 සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 50ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම Heyley’s pvt ltd, හෝමාගම
- 2024.04.08 කොළඹ අවට ආයතන කීපයක සේවක සේවිකාවන් 30ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. NIOSH Auditorium, ජාවත්ත
- 2024.04.24 Coco link pvt ltd - වවුනියාව ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 10ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- 2024.04.24 Greenly Global pvt ltd - වවුනියාව ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 15ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- 2024.05.28 Greenland Estate හි සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 32ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. Greenland Estate, බදුල්ල
- 2024.06.14 MAS Active pvt ltd, මිද්දෙණිය ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 22ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- 2024.07.16 හුංගමSanduni Pharmaceuticals ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 32ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- 2024.07.29 BOI Zone හි ආයතන කීපයක සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. BOI Zone - බියගම
- 2024.09.11 Heyley's Fiber Plc ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 32ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම Heyley's Fiber Plc - කුලියාපිටිය
- 2024.09.13 Wathuravila Tea Factory ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 31ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම Wathuravila Tea Factory, කහදූව
- 2024.10.29 Elastomeric Engineering Company (pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 24ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම Elastomeric Engineering Company (pvt) ltd - හොරණ
- 2024.11.11 ITC One ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 12ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම ITC One - කොළඹ

- 2024.11.20 NIOSL Diamonds (pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 15ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.NIOSL Diamonds (pvt) ltd – නාවල
- 2024.11.22 Brandix Apparel Solution (pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 30ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම Brandix Apparel Solution (pvt) ltd - රත්මලාන
- 2024.11.26 කළුතර කර්මාන්තපුරයේ ආයතන කීපයක සේවක සේවිකාවන් හා කලමණාකාරිත්වය 30 දෙනෙකු පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම. කර්මාන්තපුරය - කළුතර
- 2024.12.10 හා 11 ICT Construction (Pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 15ක් පමණ හා Britania Garment Packages (Pvt) ltd ආයතනයේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 12ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම ICT Construction (pvt) ltd - කොළඹ Britania Garment Packages (Pvt) ltd - මහරගම
- 2024.12.18 ෆාම් ගාඩ්න් තේ කර්මාන්තශාලාවේ සේවක සේවිකාවන් හා කළමණාකාරිත්වය 20ක් පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම ෆාම් ගාඩ්න් තේ කර්මාන්තශාලාව - රත්නපුර
- 2024.12.27 වෙස්ටර්න් පේපර් ඉන්ඩස්ට්‍රීස් සමාගමේ සේවක සේවිකාවන් හා කලමණාකාරිත්වය 35ක් පමණ, නැවුරාබ් සමාගමේ සේවක සේවිකාවන් හා කලමණාකාරිත්වය 40ක් පමණ හා කොරියන් පැකේජින් සමාගමේ සේවක සේවිකාවන් 45 දෙනෙකු පමණ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම වෙස්ටර්න් පේපර් ඉන්ඩස්ට්‍රීස් සමාගම - පානදුර නැවුරාබ් සමාගම - පානදුර කොරියන් පැකේජින් සමාගම - පානදුර

7.2 අධ්‍යාපනික ආධාර වැඩසටහන්

- 2024.01.31 අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 2,000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.02.17 මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,200 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.

- 2024.02.24 කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.03.02 මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.03.10 කුරුණෑගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 971 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.03.17 පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.03.26 මාතලේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,198 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.03.30 වවුනියාව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,350 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.04.06 ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,300 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.04.20 මන්නාරම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 998 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.04.27 රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.05.04 මුලතිව් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 929 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.05.11 හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,600 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.

- 2024.05.18 නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 938 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.06.01 බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 967 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.06.08 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 911 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.06.15 පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 973 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.06.23 අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.06.29 මඩකලපුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.07.06 මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,276 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.07.13 කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 1,000 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.07.19 කලුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 968 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.07.25 ගාල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 2,481දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.
- 2024.07.27 සහ 2024-12-11 වන දිනවල කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක අඩු ආදායම්ලාභී කම්කරු පවුල්වල අධ්‍යාපනය ලබන දූ දරුවන් 2,766 දෙනෙකු වෙනුවෙන් පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.